## ගෘහ ආර්ථික විද්‍යාව

## 13 ශ්‍රේණිය – 2019 – II වාර පරීක්ෂණය

### I කොටස

කාලය පැය 03

- **පළමුවන ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න හයකට පිළිතුර සපයන්න.**

01. (1) ප්‍රශස්ථ ජීවන පරිසරය යන්න හඳුන්වන්න.

(2) ජාතික විදුලිබල පද්ධතියෙන් නිවසට ලබා ගන්නා විදුලි ප්‍රමාණය තීරණය කිරීමට සලකා බලනු ලබන සාධක 02 ක් ලියන්න.

(3) දුෂ් පෝෂණයේ ප්‍රධාන ආකාර 2 කි. ඒවා නම් කරන්න.

(4) යකඩ ඌණ වීම නිසා ඇතිවන නීරක්තියට බලපාන ප්‍රධාන හේතු 2 ක් ලියන්න.

(5) පෙර පිරියම් කිරීම ලෙස හඳුන්වන්නේ කුමක්ද?

(6) ක්ෂුද්‍ර ජීවීන්ගේ බලපෑම නිසා විනාශ වන කෙඳි වර්ග 2 ක් ලියන්න.

(7) සංචාරණය යනු කුමක්ද?

(8) කාබනික ගොවිතැන ලෙස හඳුන්වන්නේ කුමක්ද?

(9) වාචික සන්නිවේදනයේ වාසි 2 ක් ලියන්න.

(10)ශරීරයට අත්‍යාවශ්‍ය බහු අසංතෘප්ත මේද අම්ල 2 ක් නම් කරන්න.

02. (1) ගොඩනැගිලි හා අවට පරිසර නිර්මාණයේ දී සලකා බැලිය යුතු උපයෝගිතා සාධකයක් වන සැකැස්ම හා පිහිටීම යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? (ල:3)

(2) තිරසරබව ඇතිකිරීමේ උපක්‍රමයක් ලෙස වර්තමානයේ දී හරිත ගොඩනැගිලි නිර්මාණයට යොමු වී තිබේ. හරිත සංකල්පයට අයත් මූලිකාංග මොනවාද? කෙටියෙන් පහදන්න. (ල:3)

(3) විදුලි උපකරණ භාවිතයේ දී ඒවා නිවැරදි හා ප්‍රශස්ථ ලෙස භාවිතා කළ යුතුය. ඒ සඳහා උදාහරණ 5 ක් ලියන්න. (ල:5)

(4) මිනිස් හා සත්ව මල සමග ජලයට එක්වන රෝග කාරක ක්ෂුද්‍රජීවීන් නිසා පානිය ජලය පරිභෝජනය විශාල ගැටලුවක් බවට පත්වී ඇත. සාකච්ඡා කරන්න. (ල:5)

03. (1) බහුලව හමුවන පොලිසැකරයිඩ වර්ග තුනකි. නම් කරන්න. (ල:3)

(2) අත්‍යාවශ්‍ය ඇමයිනෝ අම්ල හා අත්‍යාවශ්‍ය නොවන ඇමයිනෝ අම්ල යන්න හඳුන්වා උදාහරණ දෙක බැගින් ලියන්න. (ල:4)

(3) ආහාර වේලක් තුළ ධාන්‍ය හා ධාන්‍ය නිෂ්පාදිත ඇතුළත් කර ගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ල:4)

(4) ආහාරයේ අඩංගු ප්‍රෝටීන් ජීර්ණය වන ආකාරය පැහැදිලි කරන්න. (ල:5)

04. (1) ආහාර නරක්වීම යන්න හඳුන්වා නරක් වූ ආහාරයක ලක්ෂණ ලියන්න.

(2) පාස්ටරීකරණය යන්න පැහැදිලි කර පාස්ටරීකරණයේ දී භාවිතා කෙරෙන මූලික ක්‍රමවේද දෙක පිළිබඳව විස්තර කරන්න.

(3) a - ආහාර ආකලන යන්න හඳුන්වන්න.

b - ආහාර ආකලනය මගින් ආහාරයට සිදුවන බලපෑම පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

(4) ප්‍රතිඔක්සිකාරක යන්න හඳුන්වා ප්‍රතිඔක්සිකාරක වල අවශ්‍යතාවය පැහැදිලි කරන්න.

05. (1) නිමි ඇඳුම් කර්මාන්තශාලාවක සිදුකෙරෙන ක්‍රියාවලියේ පියවර පිළිවෙලින් ලියන්න.

(2) රෙදිපිළි කර්මාන්තයේ විකාශය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(3) ආදර්ශ මිමි වගුව ඇසුරින් පහත සඳහන් මිනුම් දෙක ගණනය කරන්න.

i. ඉන මිනුම

ii. උකුල මිනුම

ඉන මිනුම – 66 cm උකුල මිනුම – 93 cm

(4) වර්තමානයේ මෝස්තර ගන්වන ලද රෙදි සඳහා වැඩි ඉල්ලුමක් පවතී. මේ සඳහා ඔබ දක්වන අදහස් පැහැදිලි කරන්න.

06. (1) "සම්පත් යන්න" හඳුන්වන්න.

(2) ස්වභාවික සම්පත්, පුනර්ජනනීය සම්පත් ලෙස හඳුන්වන්නේ ඇයි?

(3) සංචාරක කර්මාන්තයේ සංවිධානය සහ ව්‍යුහයට ඇතුළත් විවිධ අංග මොනවාද?

(4) හරිත පාරිභෝගිකයා, පරිසරයට සිදුවන හානි අවම කිරීම සඳහා ක්‍රියාකරන්නෙකි. හරිත පාරිභෝගිකයෙක් තුළ දැකිය හැකි ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න.

07. (1) "ආහාර පංගුව" යන්න පැහැදිලි කරන්න.

(2) අධිපෝෂණයෙන් පෙලෙන පුද්ගලයෙකු සඳහා දිවා ආහාර වේලක් සැළසුම් කරන්න.

(3) අධි රුධිර පීඩනය ඇති පුද්ගලයෙකු සඳහා ආහාර වේල් සැළසුම් කිරීමේ දී සැලකිය කරුණු මොනවාද?

(4) විවිධ උත්සව සංවිධානයේ දී සලකා බැලිය යුතු කරුණු පහක් දක්වන්න.

08. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් හතරක් පිලිබඳ කෙටි සටහන් ලියන්න.

(1) නිර්මාණකරණයේ "මුලික සාධක" වන සංකල්පය.

(2) ශරීර ස්කන්ධ දර්ශක අගය.

(3) කෘතිම කෙඳි නිෂ්පාදනය හා සම්බන්ධ ද්‍රවායන කැටීම.

(4) ලිඛිත සන්නිවේදනය.

(5) මෙලාඩ් ප්‍රතික්‍රියාව.